# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2019/3 - 2017 මැයි මස 15 වැනි සඳුදා - 2017.05.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 7/3/1/2-10.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/9/2013/WS/473.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගොඩ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, මොරගස්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද, අංක අ.ග.පි. 33 හි අ.කි. 18 හි කැබලි අංක 372 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1010 ක පමණ වන ''මහවත්ත'' නමැති ඉඩම් කැබැල්ලට මායිම් :

උතුරට: කැබලි අංක 336 2/2 සහ හෝමාපොල (අ.ග.පි. 42); නැගෙනහිරට: හෝමාපොල (අ.ග.පි. 42 සහ කැබලි අංක 6); දකුණට: කැබලි අංක 336 2/2 සහ 6; බටහිරට: කැබලි අංක 6 සහ 336 2/2.

මහජන කටයුත්ත කුමක්ද යන වග: — විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ වල්මෝරුව ජල ටැංකිය ඉදිකිරීම සඳහා.

ඉඩමේ නම: මහවත්ත; හිමිකම් කියන අය: කෝණාර මුදියන්සේලාගේ විජේරත්න බංඩා මහතා, අංක 09 කෝන්ගහමුල, පලාපත්වල.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 ජූනි මස 21 වැනි දින පෙ. ව.10.00 ට පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 මැයි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්ලිව්. එම්. ආනන්ද,
ප්‍රාදේශීය ලේකම්,
පල්ලේපොල.

2017 මාර්තු මස 20 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 05